
# <u>පුවත්පත් නිවේදනය</u>

## 2013 පළමු භාගයේ රක්‍ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය


රක්‍ෂණ කර්මාන්තය, 2013 ප්‍රථම භාගයේ ද වර්ධනයක් පෙන්නුම් කර ඇත. සමස්ථ දළ ලිඛිත වාරිකය (GWP) 9.06%ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, 2012 වසරේ එම කාලය හා සසඳන විට මුළු වත්කම් 23.95%ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2013 ජූනි මස 30 වැනි දින දක්වා ගතවූ මාස හයට දීර්ඝ කාලීන (ජීවිත) සහ සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාරවල සමස්ත දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 47,749ක් වූ අතර එය 2012 පළමු හය මස තුල ලැබූ ආදායම වන රුපියල් මිලියන 43,782 හා සසඳන විට 9.06%ක වර්ධනයක් ලෙස දක්වෙයි. සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාරවල දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 28,189 ක් වූ අතර (2012 පළමු භාගයේදී එය රුපියල් මිලියන 26,017කි) දීර්ඝ කාලීන ව්‍යාපාරවල දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 19,560ක් විය. (2012 පළමු භාගයේදී එය රුපියල් මිලියන 17,764ව පැවතින) එබැවින්, පසුගිය වසරේ අදාල කාලයට සාපේක්‍ෂව 2013 පළමු භාගයේදී සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්‍ෂණ ව්‍යාපාරවල සමස්ථ දළ ලිඛිත වාරික ආදායම පිළිවෙලින් 8.35% සහ 10.11% වශයෙන් වර්ධනයක් පෙන්නුම් කරයි.




2013 ජූනි 30 වැනි දිනට රක්‍ෂණ සමාගම්වල මුළු වත්කම් රුපියල් මිලියන 345,942ක් දක්වා වැඩිවීමක් පෙන්නුම් කරන අතර, එය 2012 වසරේ ජූනි 30 වැනි දිනට පැවති රුපියල් මිලියන 279,103ට සාපේක්‍ෂව 23.95%ක වර්ධනයක් වේ. 2013 පළමු භාගය අවසානයේ දීර්ඝ කාලීන රක්‍ෂණ ව්‍යාපාර වත්කම් රුපියල් මිලියන 210,475ක් විය. (2012 ප්‍රථම භාගය අවසානයේ එය රුපියල් මිලියන 171,271කි).

ඒ අනුව, 2013 පළමු හය මස තුළ සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර වත්කම් රුපියල් මිලියන 135,467ක් විය. (2012 ප්‍රථම භාගය අවසානයේ එය රුපියල් මිලියන 107,832කි). ඒ අනුව වර්ධනය පිළිවෙලින් 22.89% සහ 25.63%ක් ලෙස දැක්විය හැකිය.




පනතේ 25 වන වගන්තියේ දැක්වෙන ආකාරයට, සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර තාක්‍ෂණික සංචිතයේ වත්කම්වලින් 20%ක් ද, දීර්ඝ කාලීන (ජීවිත) රක්‍ෂණ ව්‍යාපාර අරමුදලේ වත්කම්වලින් 30%ක් ද රජයේ සුරැකුම්පත් තුළ ආයෝජනය කළයුතු වේ. එය සෑම රක්‍ෂණ සමාගමක්ම අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයකි. 2013 වසරේ පළමු හය මස තුළ මුළු දීර්ඝ කාලීන ව්‍යාපාර වත්කම්වලින් 46.24%ක් වන රුපියල් මිලියන 97,331ක් ද (2012 පළමු භාගයේදී එය රුපියල් මිලියන 85,988; 50.21%ක් ද) මුළු සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර වත්කම්වලින් 19.93%ක් වන රුපියල් මිලියන 26,994ක් ද (2012 පළමු භාගයේදී එය රුපියල් මිලියන 31,916; 29.60%ක් විය) රජයේ සුරැකුම්පත් මත ආයෝජනය කරනු ලැබීය. එයාකාරයෙන්, 2013 ජූනි 30 දිනට සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර තාක්‍ෂණික සංචිතයෙන් සහ මුළු දීර්ඝ කාලීන (ජීවිත) රක්‍ෂණ අරමුදලේ වත්කම්වලින් ආයෝජනය කරන ලද මුළු වත්කම් 35.94%ක් වන රුපියල් මිලියන 124,325ක් වේ. (2012 පළමු භාගයේදී එය රුපියල් මිලියන 117,904; 42.24%කි) මෙය පනතේ සඳහන් රජයේ සුරැකුම්පත් තුළ ආයෝජනය කළ යුතු ප්‍රමාණය ඉක්මවා යාමකි.

පනතේ 98 වැනි වගන්තිය යටතේ, මණ්ඩලය, රක්‍ෂණ සමාගම් වල රක්‍ෂණ ඔප්පුහිමියන්ගේ හිමිකම් නොගෙවීම් සම්බන්ධ පැමිණිලි සොයා බලනු ලැබේ. මෙම කාල සීමාව තුළ ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය එවැනි පැමිණිලි 122ක් විමර්ශනයට ලක් කර ඇත.

2013 ජූනි 30 වන විට ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය යටතේ රක්‍ෂණ සමාගම් (රක්‍ෂණකරුවෝ) විසි දෙකක් (22) ලියා පදිංචි වී ඇත. ඉන් දොළහක් (12) සංයුක්ත සමාගම් (සාමාන්‍ය සහ දීර්ඝ කාලීන රක්‍ෂණ ව්‍යාපාර) වන අතර හතක් (07) සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර සඳහාද, තුනක් (03) දීර්ඝ කාලීන (ජීවිත) රක්‍ෂණ ව්‍යාපාර පමණක් සිදු කරනු ලබයි. සීමාසහිත සෙලින්කෝ තකාෆුල් 2009 අගොස්තු 05 වැනිදා සිට රක්‍ෂණ ව්‍යාපාරයේ නොයෙදේ.

පනතේ 82 වැනි වගන්තිය යටතේ රක්‍ෂණ තැරැව්කාර සමාගම් 57ක් ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය සමග ලියාපදිංචිව සාමාන්‍ය රක්‍ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ ප්‍රධාන වශයෙන් යෙදී සිටියි. 2013 ප්‍රථම භාගයේ දී රක්‍ෂණ තැරැව්කරු සමාගම් මගින් සාමාන්‍ය රක්‍ෂණ වාරිකවලින් ජනනය කළ ආදායම රුපියල් මිලියන 6,580ක් වූ අතර (2012 පළමු භාගයේදී එය රුපියල් මිලියන 6,193ක් ද) දීර්ඝ කාලීන (ජීවිත) රක්‍ෂණ ව්‍යාපාර වාරිකවලින් ජනනය කරන ලද ආදායම රුපියල් මිලියන 89කි (2012 පළමු භාගයේදී එය රුපියල් මිලියන 120කි). රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 6,670ක් ද විය. ඊට සාපේක්‍ෂව 2012 ප්‍රථම භාගයේදී ජනනය කළ ආදායම රුපියල් මිලියන 6,313ක් වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් 5.64%ක වර්ධනයක් ලෙස පෙන්නුම් කෙරේ.

වර්ෂ 2000 අංක 43 දරන රක්‍ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව ශ්‍රී ලංකා රක්‍ෂණ කර්මාන්තය විධිමත් කිරීම සහ අධීක්‍ෂණය වන්නේ ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය මගිනි. ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය, විචක්ෂණශීලී නියාමන ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ රක්‍ෂණ කර්මාන්තය වෙනුවෙන් නිසි මග පෙන්වීමක් කරනු ලබයි.

සටහන: වර්ෂ 2000 අංක 43 දරන රක්‍ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන වලට අනුව ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය විසින් නිකුත් කළ ලියාපදිංචි සහතික පත්‍රයක් නොමැතිව කිසියම් පුද්ගලයෙකුට රක්‍ෂණ ව්‍යාපාරයේ හෝ රක්‍ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ නියැලීමට අවසරයක් නොමැති බව මහජනතාව මෙමගින් දැනුවත් කරනු ලැබේ. එබැවින් බලය ලත් රක්‍ෂණ සමාගම් සහ රක්‍ෂණ තැරැව්කාර සමාගම් සමග පමණක් රක්‍ෂණ ගණුදෙනු කරන ලෙස මහජනතාවට අවවාද කරනු ලැබේ.

බලයලත් රක්‍ෂණ සමාගම් සහ තැරැව්කාර සමාගම් සම්බන්ධ තොරතුරු, "වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සම්බන්ධතා අංශය, ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය, 11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01" හෝ පහත සඳහන් වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

| | |
|---|---|
| දුර කථන: 011 2396184 -9 | ෆැක්ස්: 011 2396190 |
| විද්‍යුත් තැපැල: info@ibsl.gov.lk | වෙබ් අඩවිය: www.ibsl.gov.lk |

**ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය**

11 වන මහල, නැගෙනහිර කුළුණ

ලෝක වෙළඳ මධ්‍යස්ථානය

කොළඹ 01